# සමන් හරිම හොඳ ළමයෙක්



එස්. ඒ. විහෙළි සෙව්මිණී ද සිල්වා

# සමන් හරිම හොඳ ළමයෙක්


## එස්. ඒ. විහෙළි සෙව්මිණී ද සිල්වා

කතෘ



පළමු දිගහැරීම

මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2 ශ්‍රේණිය D

කෘතිය පළ කරන දිනය : 2025.02.08

ISBN: 978-624-208-544-9

## ~ පිදුම ~

නැතත් හිස මත රජ කිරුළු
කුමරියක සේ මා රකිනා
අප්පච්චිටත්,

තෙරක් නොපෙනෙන
මහ සයුර සේ සෙනෙහෙ දෙන
අම්මාටත්,

ගසට පොත්ත මෙන්
නිබඳ සිටිනා පුංචි දඟයා
මල්ලිටත්,

මාගේ ප්‍රථම අකුරු ගෙතුම පුදමි මම ආදරෙන්...

# ~ පෙරවදන ~

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණිය යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසැල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත් වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# මේ ඉන්නේ පුංචි සමන්



එයා දවසක්
ඉස්කෝලේ
යනකොට පුංචි බලු
පැටියෙක් පාරේ
ඉන්නවා දැක්කා.



“ඇයි පැටියෝ ඔයාට
බඩගිනිද?”
සමන් ඇහුවා.



“බව්... බව්...”
බලු පැටියා කෙඳිරි ගෑවා.

ඒක දැකලා සමන්ට දුක
හිතුනා.

“මෙන්න ඔයාට
මගේ කෑම එක...”



සමන් දුන්න කෑම එක බලු
පැටියා ආසාවෙන් කෑවා.
සමන්ට හරිම සතුටුයි.


කෑම කාපු බව්වා වලිගය
වන වනා සමන්ගේ
පස්සෙන් පාසල ළඟටම
ආවා.




සමන් පන්තියට
ගිහින් දවසේ වැඩ
ටික හොදින් කළා.



විවේක කාලය ආවා.
ළමයි හැමෝම කෑම
කන්න ගත්තා.






“ඇයි සමන්
පුතා කන්නේ
නැත්තේ, කෑම
ගෙනාවේ
නැද්ද?”
ගුරුතුමිය
ඇසුවා.




“අද මම කෑම එක
බඩගින්නේ උන්න බලු
පැටියෙකුට දුන්නා”
සමන් උත්තර දුන්නා.




“සමන්
කරලා
තියෙන්නේ
හොඳ
වැඩක්.”
ගුරුතුමිය
සමන්ව
අගය කළා.




යාලුවෝ හැමෝම සමන්ට
එයාලගේ කෑම වලින්
කොටසක් දුන්නා.




හැමෝම එකතු වෙලා කෑම කෑවා.




“පුතාලා හැමෝම අද කළේ
හොඳ වැඩක්...”



“බඩගිනි වෙලා
ඉන්න ඕනෙම
කෙනෙකුට
කෑම දෙන
එකත්, බෙදා
හදා ගන්න
එකත් පිං සිදු
වන දෙයක්.”



ගුරුතුමිය
හැමදෙනාවම
අගය කළා.



හැමෝටම
සතුටුයි.

# ~ පසුවදන ~



රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍යය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල්, කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැපකිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැක. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක් වීමත් සමග දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණය ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසී පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

**ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,**
**සෙනෙවිරත්න මහ ලේකම්**

ISBN: 978-624-208-544-9